## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

2017 අප්‍රේල් මස 25 වන දින පෙ.ව. 9.30 ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2017.02.21** දින අසන ලද ප්‍රශ්නය;

( ප්‍ර/vi(1)/ 17/10)

අ. කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 තුළ භාවිතයට ගතහැකි පොදු ළිං කීයක් තිබේද?

ආ. එම පොදු ළිං වලින් පානීය ජලය ලබාගැනීමට සුදුසු පොදු ළිං කීයක් තිබේද?

ඇ. කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14න් භාවිතයට ගතහැකි පොදු ළිං ප්‍රමාණය කොතෙක්ද?

ඈ. ඒවායෙන් පානීය ජලය ලබා ගැනීමට හැකි පොදු ළිං ප්‍රමාණය කීයද?

ඉ. ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 19 තුළ භාවිතයට ගතහැකි පොදු ළිං ප්‍රමාණය කොතෙක්ද?

ඊ. ඒවායෙන් පානීය ජලය ලබාගැනීමට හැකි පොදු ළිං ප්‍රමාණය කීයද?

උ. බස්නාහිර පළාත තුළ පෞද්ගලික ඉඩම්වල භාවිතයට ගතහැකි පෞද්ගලික ළිං කීයක් තිබේද?

ඌ. එම දිස්ත්‍රික්ක තුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් පෞද්ගලික ළිං කීයක් තිබේද?

ඒ. නියං සමයේදී ජල කප්පාදුවකින් තොරව බස්නාහිර පළාත තුළ ජලය සැපයි හැකිබව තහවුරු කළ හැකිද?

ඓ. බස්නාහිර පළාතට පිරිසිදු පානීය ජලය ලබාදෙන ජල මූලාශ්‍ර මොනවාද?

ඔ. ඒවායේ පවතින ජල ධාරිතාව කොපමණ කලකට ප්‍රමාණවත්ද?

**2. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු මාර්ග,ප්‍රවාහන ඝාමූපකාර සංවර්ධ හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රා සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.04.04 දින අසන ලද ප්‍රශ්නය;**
(ප්‍ර/vi(1)/17/

(අ) පසුගිය වසර තුල පළාත් අයවැයෙන් වෙන්කරන ලද මුදලින් ඔබ අමාත්‍යාංශය මගි ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන් සඳහා සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘ වෙන් වෙන් වශයෙන් මොනවාද?

(ආ) ඉහත ලෙස ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කර ඔබ අමාත්‍යාංශය මඟින් කලි වසරට වඩා ප්‍රගතියක් අත්කර ගෙන ඇති ක්ෂේත්‍ර / අංශ මොනවාද?

(ඇ) සංවර්ධනය සඳහා දිගින් දිගටම මුදල් වැය කලත් කලින් වසරට සාපේක්ෂව ප්‍රගතිය අත්කර ගෙන නොමැති ක්ෂේත්‍ර / අංශ මොනවාද?

(ඇ) එවැනි කලින් වසරට වඩා ප්‍රගතින් අත්කරගෙන නොමැති ක්ෂේත්‍ර / අංශ වඩා ඵලදා බවට පත්කර ගැනීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

(ඉ) එකී ව්‍යාපෘතීන්ට අමතරව මෙම නව වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් න රැකියා උත්පාදනය කල හැකි නව ව්‍යාපෘති පවතින්නේද?

(ඊ) එසේ නම් ඒ මොනවාදැයි ඉදිරිපත් කරන්නේද?

(උ) නොඑසේනම් ඒ මන්ද?

**3. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමා සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.04.04 දින අසන ලද ප්‍රශ්නය;** (ප්‍ර/vi(1)/17/30)

(අ) පසුගිය වසර තුල පළාත් අයවැයෙන් වෙන්කරන ලද මුදලින් ඔබ අමාත්‍යාංශය මඟි ගම්පහ, කළුතර සහ කොළඹ දිස්ත්‍රික්කයන් සඳහා සිදු කරන ලද සංවර්ධන ව්‍යාපෘ වෙන් වෙන් වශයෙන් මොනවාද?

(ආ) ඉහත ලෙස ව්‍යාපෘති සඳහා මුදල් ආයෝජනය කර ඔබ අමාත්‍යාංශය මඟින් කලින වසරට වඩා ප්‍රගතියක් අත්කර ගෙන ඇති ක්ෂේත්‍ර / අංශ මොනවාද?

(ඇ) සංවර්ධනය සඳහා දිගින් දිගටම මුදල් වැය කලත් කලින් වසරට සාපේක්ෂව ප්‍රගතිය අත්කර ගෙන නොමැති ක්ෂේත්‍ර / අංශ මොනවාද?

(ඇ) එවැනි කලින් වසරට වඩා ප්‍රගතින් අත්කරගෙන නොමැති ක්ෂේත්‍ර / අංශ වඩා ඵලදා
බවට පත්කර ගැනීමට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග මොනවාද?

(ඉ) එකී ව්‍යාපෘතීන්ට අමතරව මෙම නව වසරේ ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් න
රැකියා උත්පාදනය කල හැකි නව ව්‍යාපෘති පවතින්නේද?

(ඊ) එසේ නම් ඒ මොනවාදැයි ඉදිරිපත් කරන්නේද?

(උ) නොඑසේනම් ඒ මන්ද?

**4.** ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රි
**සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත**
**පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු**
**ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන**
**2017.04.04 දින අසන ලද ප්‍රශ්නය;** (ප/vi(1)/17/34)

(අ) 2014 වර්ෂය හෝ ඊට ආසන්න වර්ෂයකදී බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව විසින්
නඩත්තු කරන බණ්ඩාරගම නව බස් රථ නැවතුම්පලෙහි පිහිටි ගොඩනැගිල්ල
සහ එහි වහලය අලුත්වැඩියා කරන ලද බව ඔබතුමා දන්නෙහිද?

(ආ) ඒ සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය කොතෙක්ද?

(ඇ) මෙම ව්‍යාපෘතිය ටෙන්ඩර් ප්‍රදානය මඟින් සිදු කරන ලද්දක්ද? නොඑසේ නම්
ප්‍රාදේශීය සභාවේ සෘජු ශ්‍රමික පදනම මත සිදු කරන ලද්දක්ද?

(ඈ) ටෙන්ඩර් ප්‍රදානය මඟින් සිදු කරන ලද්දේ නම් ගිවිසුම් ගත ටෙන්ඩර්කරු හෝ
ආයතනය කුමක්ද?

(ඉ) එම වහළය සඳහා යොදා තිබූ සෙවිලි තහඩු සියල්ලම ඉවත් කරන ලද බව
ඔබතුමා දන්නෙහිද?

(ඊ) එසේ ඉවත් කරන ලද තහඩු ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ප්‍රාදේශීය සභා
ගිණුමට බැර කර තිබේද? නොඑසේ නම් ඒවාට සිදු වූයේ කුමක්ද?

**5.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමා
**සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයු**
**පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2017.04.04 දින අසන ලද ප්‍රශ්නය;** (ප/vi(1)/17/36)

(අ) (i) ගම්පහ සණස මඟින් මිලියන 106 වියදම් කර ඉදිකල සණස සුවසෙවන
ගොඩනැගිල්ල ගම්පහ රෝහලට පරිත්‍යාග කර ඇති බව ඔබතුමා දන්නේද?

(ii) එය පරිත්‍යාග කර මේ වන විට කොපමණ කාලයක් ගත වී තිබේද?

(ආ) (i) මෙම සණස සුචිපෙළින් කුමන කටයුතු සඳහා භාවිතා කිරීමට තීරණය කර තිබේද?

(ii) මෙපමණ වටිනා ගොඩනැගිල්ලක් මෙතෙක් කල් භාවිතයට නොගෙ තිබෙන්නේ කුමන හේතුවක් මතද?

**6.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කල කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබ අමාත්‍යතුමාගෙන් 2017.04.04 දින අසන ලද ප්‍රශ්නය; (ප්‍ර/vi(1)/17/37)

අ. පාසල්වලට විදුහල්පතිවරුන් පත්කිරීම සඳහා වූ ක්‍රමවේදය කුමක්ද?

ආ. ක්‍රමවේදයකින් බැහැරව විදුහල්පතිවරුන් පත්කළ හැකිද? එසේනම් කෙබඳු තත්ත්වයක් යටතේද?

ඇ. විදුහල්පතිවරුන් පත් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් නොවූ අයත් සලකා බලන්නේද? ඒ කෙබඳු තත්වයක් යටතේද?

ඈ. පශ්චාත් උපාධියක තත්ත්වය විදුහල්පතිවරුන් පත්කිරීමේදී නීති ඩිප්ලෝමාවටත ලැබෙන්නේද?

ඉ. පාසලක සිටින විදුහල්පතිවරයාට නොදන්වා අළුතින් විදුහල්පතිවරයෙකුට වැඩ භාරදිය හැකිද?

ඊ. විදුහල්පතිවරයාගේ අනුදැනුමකින් තොරව ලොග් සටහන් පොත පරිහරණය කළ හැකිද? ඒ කෙබඳු තත්ත්වයක් යටතේද?

උ. විශ්‍රාමික අධ්‍යාපන නිළධාරීන්ට හා විදුහල්පතිවරුන්ට පාසල තුළ ගුරුවරුන්ට අණදීමට හා බලපෑම් කිරීමට නෛතික බලයක් තිබේද? නැතිනම් එසේ කළ අය සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඌ නැගෙනහිර ඇරැව්වල ධර්මපාල විද්‍යාලයට නව විදුහල්පතිවරියක් පත්කිරීමේදී ඉහත සඳහන් අනීතික ක්‍රියා සිදුව ඇති බව ඔබතුමා දන්නේද?

එ. කලාප අධ්‍යාපන කාර්යාලය පවා නොදැනුවත්ව බප/පිළි/නැගෙනහිර ඇරැව්ව ධර්මපාල විද්‍යාලයට විදුහල්පතිවරයෙකු පත්කරන්නේ කෙසේද?

ඒ. එසේ පත්කර ඇත්තේ කවර බලධාරියෙකු විසින්ද?

ඔ. අත්තනෝමතික ස්ථානගත කිරීම් මගින් පාසල් පද්ධතියට සිදුවන හානිය වගකියන්නේ කවරහුද?

ඕ. මෙම පත්කිරීම සම්බන්ධව වැරදි නිවැරදි කිරීමට ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

**7.** ගරු එච්.එම්. උපාලි කොඩිකාර මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග,ප්‍රවාහන,සමූපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් **2017.04.04** දින අසන ලද ප්‍රශ්නය;

( ප්‍ර/vi(1)/17/38)

---

අ) බ.ප මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරියේ මූල්‍ය පාලන තනතුරු සඳහා පුරප්පාඩු තිබූ බව ඔබතුමා දන්නෙහිද?

ආ) එම තනතුරු දෙක සඳහා අයදුම්කරුවන් බඳවා ගත්තේ කෙසේද?

ඇ) මෙම තනතුරු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් මැන බැලී ද?

ඈ) ඒ කෙසේද?

ඉ) මෙම තනතුර සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකමක් නොමැති අය පත්වී ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඊ) එසේ වූයේ කෙසේද?

උ) මෙම තනතුර සඳහා සුදුසුකම්ලත් අය සම්මුඛ පරීක්ෂණයකින් තෝරා නොගත්තේ මන්ද?

ඌ) මෙම පත්කිරීම් කරන ලද්දේ ප්‍රඥප්තියේ 115 වගන්තිය යටතේද?

**8.** ගරු ඕ. එච්.ලිව්. ප්‍රසන්න සංජීව මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

( ප්‍ර/vi(1)/17/39)

---

අ. බේරුවල ප්‍රාදේශීය සභාවේ පරිගණක පුහුණු මධ්‍යස්ථානය සඳහා 2015, 2016 වර්ෂවල පාඨමාලා හැදෑරූ සිසුන් ගණන කොපමණද?

ආ. පාඨමාලා ගණන කීයද?

ඇ. ඔවුන්ගෙන් ලබාගත් මුදල් ප්‍රමාණය කොපමණද?

ඈ. ඒවා ලබා ගෙන පරිගණක මධ්‍යස්ථානයට සලසා දුන් සේවාවන් මොනාවාද?

ඉ. 2017 වර්ෂයට බඳවාගත් ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඊ. පාඨමාලා සඳහා එම දරුවන්ට අදාල පොත් කට්ටල සියල්ල ලබා දී තිබේද?

උ. දැනට අධ්‍යයන කටයුතු කරන ක්‍රමවේදය කුමක්ද?

ඌ. ගුරුවරියට ලබා දී ඇති සහායිකාවට පරිගණක සම්බන්ධ දැනුමක් තිබේද?

එ. 2014, 2015, 2016, 2017 වර්ෂවල පරිගණක පුහුණු මධ්‍යස්ථානය භාරව සිටි නිළධාරියා හෝ නිළධාරිනිය කවුද?

ඒ. මෙහි වත්කම් භාරව සිටින්නේ කවුද?

ඔ. මෙය 2014 සිට 2016 දක්වා අධීක්ෂණය කළ නිළධාරියා කවුද?

9. ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 'ඇසීමට; (පු/වි(1)/17/40)

(අ)(i) කළුතර ගල්පාත පර්යන්ත රෝහලේ සේවය කරන D.L.W තිලක් කුමාර නැමති සේවකයාගේ තනතුර කුමක්ද?

(ii) ඔහුගේ එම රෝහල් සේවා කාලය කොපමණද?

(iii) මෙම රෝහලේ සේවයට පැමිණි වර්ෂය හා දිනය කවදාද?

(ආ)(i) මෙම තැනැත්තා විසින් වසරකට ඉහත දී ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණි මන්දබුද්ධික රෝගියෙකුට පහරදීමක් සිදුකල බව ඔබ දන්නේද?

(ii) ඒ පිළිබඳව රෝහල් කමිටුවේදී කමිටු සාමාජිකයින් විසින් වාර්ථා කලද ස්ථානභාර වෛද්‍ය නිළධාරිතුමිය ඒ පිළිබඳව කිසිදු පියවරක් නොගන්නා බව ඔබ දන්නේද?

(iii) ඊට හේතු කවරේද?

(ඇ)(i) ඉහත පුද්ගලයා විසින් දිගින් දිගටම රෝගීන්හට අසභ්‍ය වචනයෙන් බැන වැදීම් කිරීම් හා තර්ජන සිදුකරන බව රෝහල් කමිටු සාමාජිකයන් වාර්ථා කරන බැවින් කමිටු සාමාජිකයින් කැඳවා තොරතුරු ලබා ගෙන පරීක්ෂණයක් සිදුකල හැකිද?

(ii) ඒ කොපමණ කලකින්ද?

(iii) එම පරීක්ෂණ වාර්ථාව සභාවට ඉදිරිපත් කරන්නේද?

**10.** ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/vi(1)/17/41)

(අ)(i) හොරණ නගර සභාව මගින් 2014 වර්ෂයේ නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ සෞඛ්‍ය තත්වය ඉහල නැංවීම හා නාගරික කාන්තාවන්ගේ ජීවන තත්වය ඉහල නැංවීම වෙනුවෙන් ක්‍රියාත්මක කල ව්‍යාපෘති මොනවාද?

(ii) ඒ සඳහා වියදම් කළ මුළු මුදල කොපමණද?

(iii) ව්‍යාපෘතිය, ව්‍යාපෘති වාර්තාව, වියදම්කල මුදල, වෙන් වෙන් වශයෙන් කවරේද?

(iv) එය සභාගත කරන්නේද?

(ආ)(i) ඉහත ව්‍යාපෘතිය යටතේ නගර සීමාව තුල කිරි අලෙවිසැල් ඉදිකලේද?

(ii) ඉදිකල කිරි අලෙවිසැල් ප්‍රමාණය කොපමණද?

(iii) ඒ කුමන ස්ථානවලද?

(iv) ඒ සඳහා වියදම් කල මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ඇ)(i) මෙම කිරි අලෙවිසැල් දැනට ක්‍රියාත්මක වන්නේද?

(ii) නොඑසේ නම් ඊට හේතු කවරේද?

(iii) මෙම අලෙවිසැල් මඟින් නගර සභාවට ලැබී ඇති ආදායම කොපමණද?

(iv) මෙම අලෙවිසැල් ලබා දීමේදී නගර සභාව ක්‍රියාත්මක කල ක්‍රමවේදය කවරේද?

11. ගරු රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ද
සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා සළ
පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයු
ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙ
ඇසීමට, (ප්‍ර/vi(1)/17/4

අ) කටුනායක සීදුව නගර සභාවේ ලේකම්වරයා කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමාවේ පොදු ඉඩමක ඉදිකිරීමක් සිදු කිරීමට අවසර දී ඇත්ද?

ආ) එසේ අවසර දීමක් කර ඇත්නම් එකී පොදු ඉඩමේ ප්‍රමාණය කොපමණද? එසේ අවසර ලබාගත් තැනැත්තාගේ නම කුමක්ද?

ඇ) එසේ ලෙස පොදු ඉඩම් කොටස්වල ඉදිකිරීම් සිදු කිරීමට අවසර දීමට ලේකම්වරයාට හැකිද?

ඈ) එසේ පරිදි පොදු ඉඩමක ඉදිකිරීමකට අවසර දී ඇත්නම් එකී ලේකම්වරයා බලය අභිබවා ක්‍රියා කිරීම සම්බන්ධව පරීක්ෂණයක් සිදු කරන්නේද?

ඉ) නොඑසේ නම් ඒ මන්ද?

12. ගරු ලක්ෂ්මන් නිපුනආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග ප්‍රවාහන සමූපකා
සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත
ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/vi(1)/17/4

අ) මහරගම විවිධ සේවා සමූපකාර සමිතිය පළාත් සමූපකාර කොමසාරිස් අධීක්ෂණය යටතේද?

ආ) 2011 වසරේ මෙම සමූපකාර සමිතියේ කටයුතු විභාගයට ලක් කළේද?

ඇ) මහරගම සමූපකාර ඉන්ධනහලේ මූල්‍ය කටයුතු පිළිබඳව වංචා සහගත තත්ත්වයක් හෙළිදරව්වීද?

ඈ) ඒ පිළිබඳව වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නේද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

"2017.04.04 වන දින පැවැති පළාත් සභා රැස්වීමේ දී එළඹුණු සභා සම්මුතීන්ට අනුකූලව, අද දින (2017.04.25 දින) විසිර යෑමෙන් අනතුරුව මෙම පළාත් සභාව 2017 මැයි මස 23 වන දින (අඟහරුවාදා දින) පෙ.ව. 9.30 ට රැස්විය යුතුය."

## X. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

01. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා :

"ගෝලීයකරණය වූ ලෝකයක ඒකීය රටක් තුළ ජාත්‍යන්තර සබඳතා ඇතිකර ගනිමින් රටේ අනාගතය සුරක්ෂිත කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, එක්ව යහපාලන රජයක් බිහිකරමින් රටේ ජනතාව වෙනුවෙන් ඉටුකරණ මෙහෙවරට බස්නාහිර පළාතේ පළාත් සභාව සිය ස්තුතිය පලකර සිටියි."

[යෝ/ VI(I)/16/ 03]

[2017.03.21 දින පැවති සභා රැස්වීමේ දී කල් තැබූ කටයුතු හා සම්බන්ධිතයි.]

02. ගරු පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා

"කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, 'රත්මලේ' ග්‍රාම නිළධාරි වසමේ පිහිටා ඇති 'තඹදොල ඇල්ල' දෙස් විදෙස් සංචාරකයින් නිතර ගැවසෙන, ඉතාමත් සුන්දර පරිසරයක් තිබෙන, අලංකාර දිය ඇල්ලකි.

මෙම ස්ථානයේ සංචාරකයින්ට අවශ්‍ය පහසුකම් සලසමින් සංවර්ධනය කර, බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය යටතේ, පවත්වා ගෙන යා යුතු යැයි, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."



(යෝ/vi(1)/16/04)

03. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන (පෙර පාසල්) වලට අමතරව, විධිමත් නොවන පරිදි පවත්වා ගෙන යනු ලබන පෙර පාසැල් විධිමත් කර ලියාපදිංචි කිරීමද, මේ සම්බන්ධව විශේෂඥ දැනුම ඇති විධිමත් උපදේශක කමිටුවක් පත් කිරීමද, ලියාපදිංචි පෙර පාසල් ගුරු භවතුන්ට මාසිකව රු. 5000/- ක දීමනාවක් ගෙවීමට සුදුසු පියවර ගැනීම ද, මැනවැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/vi(1)/17/01)

## XII. පොදු කටයුතු

01. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා(බ.ප):

යෝජනාව:

2015 අංක 04 දරණ විසර්ජන ප්‍රඥප්තිය - 07 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2016 වර්ෂය

"'අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2016' නැමැති උපලේඛනයේ දැක්වෙන පරිදි, අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේ දී, 2015 අංක 04 දරණ විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,

එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,

එම උපලේඛනයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි."

## XIII. සභාව කල් තැබීම

2017.04.05 දින.
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව